# සංවේදනය හා සංජානනය පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාත්මක ප්‍රවේශය

## Buddhist psychological approach to sensation and perception

**කරපික්කඩ සෝභිත හිමි**


## Abstract

Sensation and perception can be identified as two processes which are combined and interconnected even though it seems as one process in general, and it is proven by western psychological theories as well as Buddhist teachings. There are some differences of interpreting and analyzing these two processes in western psychological and Buddhist psychological perspectives, and some similarities can also be identified. Thus, this study aims to examine the function of the sensation and perception in accordance of the Buddhist psychological and western psychological perspectives.


**Keywords:** Sensation and perception, western psychology, Buddhist teachings, differences, similarities


**සාරසංක්ෂේපය**

සංවේදනය (sensation) හා සංජානනය (perception) නම් වූ මානසික ක්‍රියාකාරීත්වයන් සාමාන්‍ය ව්‍යවහාරය තුළ තනි ක්‍රියාකාරීත්වයක් ලෙස දැක්වුව ද මේ පිළිබඳ මනෝවිද්‍යාත්මක රාමුව ඔස්සේ විමසා බැලීමේ දී ඒ තුළ එකට බැඳි ද්විත්ව ක්‍රියාකාරී ස්වරූපයක් දැකගත හැකිය. මේ පිළිබඳ බටහිර හා බෞද්ධ උභය මනෝවිද්‍යාත්මක ඉගැන්වීම් තුළින් කරුණු තහවුරු කොටගත හැකි වේ. නමුත් උක්ත මනෝවිද්‍යාත්මක සංකල්පයන් තුළ සංවේදන හා සංජානන ක්‍රියාකාරීත්වයන්ගේ ස්වරූපය පිළිබඳ දක්වා ඇත්තේ

සමාන වූ ආකල්පයන් නොවන බව දැකගත හැකිය. එහි සමතා මෙන් ම විෂමතා ද හඳුනාගත හැකි ය. අපගේ මෙම අධ්‍යයනය තුළින් බටහිර හා බෞද්ධ මනෝවිද්‍යාත්මක විවරණයන්ට අනුකූලව සංජානනය හා සංවේදනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදුකිරීමට අපේක්ෂිත ය.

**යතුරු පද:** සංවේදනය හා සංජානනය, බටහිර මනෝවිද්‍යාව, බෞද්ධ ඉගැන්වීම්, සමානතා, විෂමතා

**හැඳින්වීම**

සංවේදනය හා සංජානනය පිළිබඳ අධ්‍යයනයේ දී ඒ තුළ ඇති සියුම් වෙනස හඳුනා ගැනීම මූලික වශයෙන් ඉතා වැදගත් ය. මේ පිළිබඳ බටහිර මනෝවිද්‍යාව තුළ දැක්වෙන විවරණය වන්නේ "සංවේදනය යනු සංවේදී ඉන්ද්‍රියයන් මඟින් පරිසරය ආශ්‍රිත තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලියයි. (Passive Process) (අබේපාල, රොලන්ඩ්, 2015, 366 පිටුව). එනම් අප ශරීරයට හා මොලයට බාහිර ලෝකයේ තොරතුරු ගෙන ඒමේ නිශ්ක්‍රීය ක්‍රියාවලියයි. පරිසරයේ පවතින විවිධ අරමුණු පිළිබඳ මූලික දැනීමක් නැතහොත් වේදයිතාවක් මිනිසා තුළ නිර්මාණය වන්නේ සංවේදනය තුළිනි. මෙය වෙනත් ආකාරයකින් දැක් වූ විට ජීවියෙකු පංචේන්ද්‍රිය උත්තේජනයකට දක්වන ප්‍රථම හෝ මූලික ප්‍රතිචාරය සංවේදනය ලෙස ද අර්ථ ගැන්විය හැක. මේ අනුව සංවේදනය යනු නිශ්ක්‍රීය හෙවත් අක්‍රීය වූ අවස්ථාවක් බව පෙනේ. එසේම එය ස්වයංක්‍රීයව සිදුවන්නකි. නිදසුනක් ලෙස අප නිවසේ, වැඩපලේ, බස්රියේ, මහමග හෝ කිසියම් ස්ථානයක සිටින විට අපගේ අවශ්‍යතාවෙන් හෝ සහභාගීත්වයෙන් තොරව ම විවිධ රූප ශබ්ද හා ස්පර්ශ ආදී වශයෙන් සංවේදනය ඇති වීම සිදු වේ. නමුත් සංජානනය මෙම ක්‍රියාකාරීත්වය ඉක්ම වූ අවස්ථාවකි. එනම් ප්‍රබෝධකයකට අවධානය යොමු කිරීමෙන් පසු ඇතිවන සවිඥානික ව දැනගැනීමේ මානසික ක්‍රියාවලිය සංජානනය ලෙස හඳුනාගත හැක. මේ තුළින් අවධානය පිණිස පංචේන්ද්‍රියයන් මඟින් ලකුණු කරගත් දෙයක් මනසින් හඳුනා ගැනීම සිදු වේ. මෙය වෙනත් ආකාරයෙන් පැවසුවහොත් සංජානනය යනු සංවේදන දත්ත ප්‍රයෝජන කරගත හැකි මානසික නියෝජනයක් බවට හරවා ගැනීමේ ක්‍රියාවලියයි.

මේ අනුව සංවේදන දත්ත තේරීමේ සංවිධානය කිරීමේ සහ අර්ථ දැක්වීමේ ක්‍රියාවලියක් මඟින් ලෝකය පිළිබඳ මානසික නියෝජනයක් ඇතිකර ගැනීම සංජානනය තුළින් සිදු වේ. බටහිර මනෝවිද්‍යාව තුළ සංජානනය පිළිබඳ දක්වා ඇති ප්‍රකට නිර්වචනය වනුයේ "ග්‍රාහක අවයව මාර්ගයෙන් ලබාගන්නා ඉන්ද්‍රිය තොරතුරු පරිසරයේ පවත්නා සංවිධිත ප්‍රතිරූපයක් වශයෙන් අර්ථකථනය කරනු ලබන ක්‍රියාවලිය" ලෙසිනි. (අබේපාල, රොලන්ඩ්, 2015, 380 පිටුව). මේ තුළින් සංවේදන හා සංජානන ක්‍රියාකාරීත්වයන් තුළ ඇති මානසික විෂමතාව පිළිබඳ හඳුනාගත හැක. මෙහිදී අප අවබෝධ කොටගත යුතු ඉතා වැදගත් කරුණක් වනුයේ සංජානනය පිණිස සංවේදනයේ ඇති වැදගත් කමයි. එනම් සංවේදනයකින් තොරව සංජානන ක්‍රියාවලියක් කිසිදු ආකාරයෙන් සිදුනොවීමයි.

**සාකච්ඡාව**

ඉහත හැඳින්වීම තුළ විග්‍රහ වූ සංවේදන ක්‍රියාකාරීත්වය සාර්ථකව සිදුවීම පිණිස මූලාශ්‍රය සපයන මානසික බලවේග යක් පවතියි. එනම් උත්තේජනයයි (stimulus). උත්තේජනය හේතුකොටගෙන පංචේන්ද්‍රිය මඟින් ශාරීරික ශක්තියක් නිෂ්පාදනය වේ. සෑම උත්තේජනයක් ම ශරීරයේ කිසියම් ශක්තියක් අවධි කරවයි. මේ අනුව ජීවියා උත්තේජනයට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාවලිය ලෙස ද සංවේදනය හැඳින්විය හැක. සෑම උත්තේජනයක්ම පංචේන්ද්‍රියයන්ගෙන් එකක් හෝ කිහිපයක් සක්‍රීය කිරීමේ හැකියාවෙන් යුක්ත වේ. එම ශාරීරික සක්‍රීයතාව තීරණය වන්නේ ලැබෙන උත්තේජනයන්හි තීව්‍රතාව අඩු වැඩි වීම අනුවය. එනම් උත්තේජනවල තීව්‍රතාව ප්‍රබල වන විට ප්‍රබල ශක්තියක් ද දුර්වල වන විට අඩු ශක්තියක් ද ජනිත වේ. මේ අනුව උත්තේජන තීව්‍රතාව ප්‍රබල හෝ දුබල වීම හේතුකොටගෙන ලැබෙන සංවේදනය ද ප්‍රබල හෝ දුබල විය හැකිය. එසේම පුද්ගලයාට සංවේදන දැනෙන නොදැනෙන සීමාවක් ද පවතී. එය මනෝවිද්‍යාව තුළ නිරපේක්ෂක එළිපත්ත (Absolute threshold) (අබේපාල, රොලන්ඩ්, 2015, 367 පිටුව). හෙවත් සංවේදන පරාසයට ඇතුලු වන දොරටුව වශයෙන් හඳුන්වා ඇත. එනම් පුද්ගලයාගේ ඉන්ද්‍රියයන්ට කිසියම් සංවේදනයක් දැනෙන අවම ප්‍රමාණයයි.

බටහිර මනෝවිද්‍යාව විග්‍රහ කරන ආකාරයට මිනිසාගේ පංචේන්ද්‍රිය සංවේදීතාව අතිශය සියුම් වේ. දැනට පවතින තත්ත්වයට වඩා එය සියුම් වී නම් පුද්ගලයා එයින් මහත් දුෂ්කරතාවලට පත්විය හැකිය. නිදසුන් ලෙස මිනිසාගේ කන තිබෙන තත්ත්වයට වඩා තවදුරටත් සංවේදී වුවහොත් හමන වායු අනු වැදීමෙන් කන්බෙරය කම්පනය වී අපට හැමවිටම ඝෝෂාකාරී හඬක් ඇසෙනු ඇත. එවිට වෙනත් ශබ්ද කිසිවක් නොඇසෙන්නට ඉඩ ඇත. එසේම නිවසේ රේඩියෝවේ හඬ නිසා වෙනත් කිසිදු ශබ්දයක් නොඇසෙන්නට ඉඩ ඇත.

සංවේදන ක්‍රියාවලිය තුළ අවබෝධ කටයුතු තවත් වැදගත් සාධකයක් වනුයේ සංවේදන අනුවර්තනයයි. (Sensory adaptation) එනම්, යම් උත්තේජනයකට දීර්ඝව නිරාවරණය වීමෙන් ඇති වන අනුවර්තනයයි. අධික ශබ්ද සහගත තැනක, අධික දුර්ගන්ධ තැනක, වායුසමනය කරන ලද තැකන රාජකාරී කරන්නා වූ අයෙකු කලකදී එම සංවේදනයන්ට අනුවර්තනය වේ. එසේ සිදුවන්නේ පුද්ගලයා ඒ සඳහා සාමාන්‍ය වශයෙන් දෙනුලබන අගය වෙනස් කිරීම තුළිනි. යම් උත්තේජනයක් දිගින් දිගට එල්ල වන විට එහි ඇති ආන්තික ඵලදායිතාව පහළ වැටේ. එසේම දීර්ඝ කාලයක් තිස්සේ කිසියම් එකම උත්තේජන රටාවකට නිරාවරණය වීමෙන් සංවේදන පද්ධතිය කිසියම් ඒකාකාරී සැකැස්මකට නිර්මාණය විය හැක. එය සමුද්දේශ රාමුව ලෙස දැක්වේ (අබේපාල, රොලන්ඩ්, 2015, 368 පිටුව). (Frame of Reference) එවිට යම් ප්‍රස්තුතයක් දෙස බලා යම් විනිශ්චයකට තීරණයකට හෝ නිගමනයකට එළඹීමේ දී ඒ ඒ පුද්ගලයාටම විශේෂ වූ සමුද්දේශ රාමුවක තැන්පත් වීමට සිදු වේ.

මෙසේ පංච ඉන්ද්‍රියන් මඟින් පුද්ගලයා බොහෝ සංවේදනයන් අතිකරගනු ලබන අතර එහි ඊළඟ ක්‍රියාකාරීත්වය වනුයේ අවධානයයි. අවධානය සංවේදනයේ ප්‍රතිඵලයකි. එනම් සංවේදනයේ වැඩිදියුණු අවස්ථාවකි. මේ තුළින් පුද්ගලයා පරිසරයේ ඇති යම් අයිතමයක් අනෙකුත් අයිතම වලින් වෙන් කොට ඒ කෙරෙහි ඒකාග්‍ර වීමේ ක්‍රියාවලිය සිදුකරනු ලබයි. එනම් කිසියම් දෙයක් හෝ සිද්ධියක් වෙත පුද්ගල මනස යොමු කිරීමයි. පුද්ගල මනසේ ස්වභාවය අනුව එක් මොහොතක අවධානය යොමු කළ හැක්කේ එක් ප්‍රබෝධකයක් වෙත

පමණි. ඒ අනුව පරිසරයේ පවතින හෝ පුද්ගල මනසේ ඇතිවන විවිධ ප්‍රබෝධක අතරින් එකක් තෝරා ඒ කෙරේ සිත යොමු කිරීම අවධානය ලෙස සැළකිය හැක. එහි දී පංචේන්ද්‍රියයන්ට හා මනසට හසුවන දේ පමණක් ග්‍රහණයට ගෙන අන් සියල්ල ඉවත දැමීම සිදු වේ. මෙහි දී ද ප්‍රබෝධකයේ ඇති වැදගත්කම, විශේෂත්වය, නවතාව, අවශ්‍යතාව මත අවධානය ප්‍රමුඛත්වය ලබාදෙයි. මනෝවිද්‍යාඥයන්ගේ අනාවරණයන්ට අනුව අවධානය තුළ දැකගත හැකි මූලික ලක්‍ෂණ තුනක් වේ.

- එකවර අවධානයට යොමු කළ හැක්කේ එක් දේකට පමණි
- අවධානය වහා වෙනස් විය හැකියි
- අවධානය එක් දෙයකින් තවත් දෙයක් වෙත මාරුවිය හැකී (අබේපාල෴ රොලන්ඩ්෴ 2015෴ 371 පිටුව)

අවධානය එල්ල වන ස්වභාවය අනුව බාහිර හා ඇතුළත වශයෙන් ගුණාංග දෙකක් දැකිය හැකිය. බාහිර යනු මතුපිටින් පෙනෙන, පඤ්චේන්ද්‍රියයන්ට ගෝචර වන, ශාරීරික හෝ භෞතික පැවැත්මක් තිබෙන දේවල් වෙත අවධානය යොමු වීමයි. ඇතුළත හෙවත් අභ්‍යන්තර වශයෙන් සළකනු ලබන්නේ හුදු මානසික චින්තනයෙන් අවධානය යොමුවීමයි.

මීට අමතරව අවධානයේ ස්වරූප කිහිපයක් පිළිබඳ මනෝවිද්‍යාඥයන්ගේ අවධානය යොමු වී ඇත. නාභිගත අවධානය, ක්‍ෂණික අවධානය, ධාරිත අවධානය ඉන් කිහිපයකි. මෙහි "නාභිගත අවධානය" යනු යම් වස්තුවකට එල්ලකරගත් අවධානය එක දිගකට යොමු කිරීම හෙවත් අවධානය ස්ථාවර කරගැනීම යි. නිදසුනක් ලෙස බෞද්ධ කසිණ භාවනාවේ දී අවධානය කිසියම් වස්තුවක් හෝ සලකුණක් මත දීර්ඝ වශයෙන් යොමු කිරීම සිදු වේ. "ක්‍ෂණික අවධානය" යනු යම් දෙයක් පිළිබඳව ඉතා ඉක්මණින් වේගවත්ව අවධානය යොමු කිරීමයි. එය එක් එක් පුද්ගලයා සතු ධාරිත හැකියාව මත වෙනස් විය හැකිය. නිදසුන් ලෙස යම් පුවත්පත් ලිපියක් හෝ පොතක් දෙස මොහොතක් බලා කෙනෙකුට අකුරු හෝ වචන රැසක් ග්‍රහණය කරගත හැකි නමුත් තවත් කෙනෙකුට එසේ ග්‍රහණය කරගත

හැකි නොවේ. මෙම අවධානය වැඩි කර ගැනීම හා පවත්වාගෙන යාම සඳහා ඇතැමුන් විවිධ වූ ප්‍රතීක ක්‍රියාවන්වල යෙදේ. ප්‍රතීක ක්‍රියා යනු ස්වකීය බලපෑමෙන් තොර හිතාමතා නොව ඉබේ මෙන් සිදුවන පුරුදු විශේෂයකි. කකුල සෙලවීම, යතුරු කැරැල්ල සෙලවීම, ඔබ මොබ සක්මන් කිරීම, දුම්වැටියක් ඉරීම, නළලේ හෝ කම්මුලෙහි අත තබා කල්පනා කිරීම, මාපට ඇඟිල්ලෙන් සෙසු ඇඟිලිවල කුනු ශුද්ධ කිරීම වැනි ප්‍රතීක ක්‍රියා නිදසුන් වශයෙන් පෙන්වා දිය හැකිය. "ධාරිත අවධානය" යනු අවධාන ශක්තිය හෙවත් ධාරිතාවයි. එහි අවස්ථා තුනක් වේ.

- කුතුහලය, අභිරුචිය, විස්මය හේතුකොටගෙන ඇතිවන උත්තේජන අවස්ථාවී
- ඉහත සාධක නිසා පුද්ගලයා තුළ අරමුණක් හෙවත් අභ්‍යන්තරික උනන්දුවක් ඇති වීම්
- මෙම අවස්ථාවන් දෙකම පසුකිරීමෙන් පසු පුද්ගලයාගේ අවධානය නිරායාස වේ එනම් එය තමන්ගේම දෙයක් බවට පත් වීමයි (අබේපාල, රොලන්ඩ්, 2015, 374 පිටුව)

බටහිර මනෝවිද්‍යාව තුළ විස්තර වන ආකාරයට පුද්ගල අවධානය සඳහා ප්‍රමුඛ වශයෙන් බලපානු ලබන සාධක දෙකකි.

01. විෂය බද්ධ සාධක (බාහිර සාධක) (Objective Factors)
02. පුද්ගල බද්ධ සාධක (අභ්‍යන්තර සාධක) ( Subjective Factors)

**විෂය බද්ධ සාධක**

- යම් වස්තුවක තීව්‍රතාව, ආකර්ෂණය, ප්‍රමාණයෙන් විශාලවීම වැනි ලක්ෂණ අවධානය දිනාගැනීමට හේතු වේ
- පුනරුක්තිය - නැවත නැවත සිදුවීම ද අවධානය එල්ලවීමට හේතු වේ
- නවතාව හෙවත් අලුත් දේ - නුහුරු නුපුරුදු දේවල් හෙවත්

විලාසිතා මෝස්තර ආදිය ද වහා අවධානය ඇද ගැනීමට හේතු වේ

- චලනය වීම - අචලව තිබෙන දේට වඩා චලනය වන දේට අවධානය යොමු වේ
- යම් වස්තුවක් හා එහි පසුබිම ඉඳුරාම වෙනස් වේ නම් ඒ කෙරේ අවධානය එල්ල වේ
- වස්තුවේ ස්වභාවය එනම් වචනවලින් කියනවාට වඩා පින්තූරයක් පෙන්වීමෙන් අවධානය යොමුකරවිය හැකියි
- අසම්පූර්ණ දේවලට වඩා සම්පූර්ණ දේවලට අවධානය වැඩි වේ
- වර්ණය හෙවත් පාට අනුව ද අවධානය අඩු වැඩි වේ
- පහළින් තිබෙන දේ වලට වඩා ඉහළින් තිබෙන දේ සඳහා අවධානය වැඩි වේ
- වස්තුව ප්‍රමාණයෙන් විශාල වීම ද අවධානය යොමුවීම සඳහා බලපානු ලබයි
- රස සුවඳ ගඳ ශබ්ද ආදියට ද අවධානය යොමු වන අතර ඒවා පුද්ගලයාට හුරු පුරුදු ප්‍රමාණයට වඩා දැනෙන විට අවධානය යොමු වේ

**පුද්ගල බද්ධ සාධක**

සිතෙහි පවතින හැඟීම් හෝ ආකල්ප හේතුකොටගෙන ඇතිවන පෙළඹීම පුද්ගල බද්ධ සාධක ලෙස දැක්වේ. මෙහි ස්වභාවය නම් එය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්වීමයි. ඒ අනුව,

- රුචිකත්වය
- ගතිපුරුදු
- අවශ්‍යතා
- මනෝභාව

- මනෝවිද්‍යාත්මක සාධක (අබේපාල෴ රොලන්ඩ්෴ 2015෴ 375-378 පිටු)

යන සාධක මත පුද්ගල අවධානය විෂම විවිධ හෝ අඩුවැඩි විය හැකිය. මෙහි දී වැදගත් කරුණක් වන්නේ විෂය බද්ධ අවධානය ක්ෂණික වීමත් කෙටිකාලීන වීමත් පුද්ගල බද්ධ අවධානය දීර්ඝ කාලීනව පැවතීමත් ය.

**සංජානනය**

පරිසරය තුළින් සංවේදනය වූ යම් ප්‍රබෝධයක් වෙත අවධානය යොමුකොට එම ප්‍රබෝධකය පිළිබඳව සවිඥානිකව දැනගැනීමේ ක්‍රියාවලිය සංජානනය නම් වේ. (අබේපාල, රොලන්ඩ්, 2015, 379 පිටුව). එනම් පඤ්චේන්ද්‍රියයන් මගින් ලකුණු කරගත් දෙයක් මනසින් හඳුනා ගැනීමයි. පුද්ගලයා පරිසරය පිළිබඳ අවබෝධ කරගනු ලබන්නේ මෙම සංජානනය තුළිනි. ඒ සඳහා පඤ්චේන්ද්‍රියයන් ආධාරක වේ. සංජානනය තුළින් සංවේදන දත්ත තේරීම, සංවිධානය කිරීම, අර්ථ දැක්වීම යන ක්‍රියාකාරීත්වයන් සිදු වන අතර ඒ සඳහා බලපානු ලබන සාධක කිහිපයක් පිළිබඳ මනෝවිද්‍යාඥයන්ගේ අවධානය යොමු වී ඇත. ඒ අතර පුද්ගල අත්දැකීම්, අභිරුචි, ආකල්ප, අවශ්‍යතා, පරිකල්පන ශක්තිය ආදි සාධක ප්‍රමුඛ වේ.

**සංජානන ක්‍රියාවලිය**

පඤ්චේන්ද්‍රියයන්ගේ කවර ඉන්ද්‍රියයක් සම්බන්ධයෙන් වුව ද සංජානනය කරගැනීමේ ක්‍රියාවලිය මූලික වශයෙන් පියවර 03 කින් සමන්විත වේ.

**01. තේරීම**

තේරීම යනු යම් ප්‍රබෝධක රැසක් අතුරින් එකක් හෝ කිහිපයක් තෝරා ගැනීමයි. මෙහි දී අනෙක් ප්‍රබෝධක නොසළකා හැරේ. සාධක තේරීමේදී ද පදනම් වන්නා වූ සාධක තුනක් පිළිබඳ මනෝ විද්‍යාඥයන් අදහස් පළකොට ඇත.

- කාය විද්‍යාත්මක සාධක
- ප්‍රබෝධක සාධක
- මනෝවිද්‍යාත්මක සාධක

**02. සංවිධානය**

ලෝකය තේරුම් ගැනීමට උපකාර වන පරිදි තොරතුරු රටා හෝ මූලධර්ම වශයෙන් සංවිධානය කරගැනීම මෙයින් අදහස් වේ. එනම් සංජානනය පිණිස හඳුනාගත් දෙයෙහි යම් සම්මත හැඩයක් හෝ ආකෘතියක් වශයෙන් හඳුනා ගැනීම හෝ තීරණය කිරීමයි. සංවේදන දත්ත සංවිධානය කිරීම අංශ කිහිපයක් යටතේ සිදු වේ. ඒ අතර හැඩය, සංජානනය, සංජානනය ස්ථාවරත්වය, ප්‍රමාණ ස්ථාවරත්වය, හැඩතල ස්ථාවරත්වය, පැහැය හා දීප්තිය, ස්ථාවරත්වය, ගැඹුර සංජානනය, පැහැය සංජානනය, චලන සංජානනය ආදි අංශ සංවිධානය තුළ ක්‍රියාත්මක වේ.

**03. අර්ථකථනය**

අර්ථකථනය යනු ලෝකය පිළිබඳ පැහැදිලි කිරීම සහ විනිශ්චය කිරීම සඳහා සංවේදන දත්ත භාවිතා කිරීමයි. එනම් පෙර කී පරිදි තේරීම හා සංවිධානය කරගන්නා ලද දත්ත ඇසුරින් හඳුනා ගැනීම හෝ සංජානනය කර ගැනීමයි. මෙසේ දත්ත අර්ථවත් කර ගැනීමේ ක්‍රියාවලියේ දී වැදගත් වන්නා වූ සාධක කිහිපයක් වේ ජීවිතයේ මුල් කාලයේ ලබන ලද අත්දැකීම් සංජානන අපේක්ෂණ හෙවත් මුල් අත්දැකීම් වල එල සංස්කෘතික සාධක පුද්ගල රුචිකම් හා අවශ්‍යතා ආදි වෙනත් බලපෑම් ඒ අතර විශේෂ වේ. (අබේපාල, රොලන්ඩ්, 2015, 381-382 පිටු).

**සංජානනය කෙරෙහි බලපානු ලබන සාධක**

සංජානනය කෙරෙහි බලපානු ලබන සාධක විෂයබද්ධ හා පුද්ගලබද්ධ වශයෙන් දෙවදෑරුම් වේ. මෙහිදී සංජානනය කරනු ලබන දේවල් හෙවත් ප්‍රබෝධක මත රැඳී පවත්නා සාධක විෂයබද්ධ සාධක ලෙස සළකනු ලබයි. ඒවා සංජානනය කරනු ලබන කාහටත් එක හා සමානව බලපායි. සංජානනය කරනු ලබන පුද්ගලයාගේ

ස්වභාවය මත රැදී ඇති සාධක පුද්ගලබද්ධ සාධක නම් වේ. මේවා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් ලෙස බලපානු ලබයි. උක්ත විෂයබද්ධ සාධක කිහිපයක් පිළිබඳ බටහිර මනෝවිද්‍යාඥයක් අවධානය යොමුකොට ඇත. ඒ අතර ප්‍රබෝධකයන්ගේ ස්ථාවර ප්‍රමාණය හා හැඩය වෙනත් ප්‍රබෝධකවල බලපෑම රූපය හා භූමිය, සමීප බව, සමාන බව, අවිච්ඡින්නතාව, පූර්ණ බව, අවසන් බව, අනුකූලතාව ආදි සාධක වැදගත් සාධක ලෙස දැක්වේ. පුද්ගලබද්ධ සාධක ලෙස හඳුන්වන්නේ පුද්ගලයාගේ අත්දැකීම් හා පළපුරුද්ද, සාරධර්ම, සමාජ ධර්මතා අවශ්‍යතා මාසික සැකැස්ම ආදි සාධකයෝ ය.

## සංවේදනය හා සංජානනය පිළිබඳ බෞද්ධ විවරණය

සංවේදනය හා සංජානනය පිළිබඳ බෞද්ධ විවිරණයන් අධ්‍යයනයේ දී එය බටහිර මනෝවිද්‍යාවෙහි විග්‍රහ වන්නා වූ සාධකයන්ට අමතරව සුවිශේෂීව විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විග්‍රහ කරනු ලබන ආකාරය දැකගත හැකි වේ. බුදුසමය තුළ සංවේදන හා සංජානන ක්‍රියාකාරීත්වයන් හැඳින්වීම සඳහා බොහෝ සෙයින් භාවිතා වන්නේ "පච්චත්ත" හෙවත් "ප්‍රත්‍යක්ෂය" යන පදයයි. එය ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය වශයෙන් දෙයාකාරව විග්‍රහ වේ. මෙයින් අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය යනු සාමාන්‍ය මානුෂීය ඉන්ද්‍රිය ගෝචරත්වය ඉක්ම වූ මානසික සංවර්ධන අවස්ථාවකි. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළ බටහිර මනෝවිද්‍යාවේ විග්‍රහ වූ සාධකයන්ට සමාන ඉගැන්වීම් රාශියක් දැකගත හැකි නමුදු මෙහිදී ද බුදුසමය විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය සඳහා සුවිශේෂ වූ වැදගත්කමක් ලබා දී ඇත. ප්‍රත්‍යක්ෂ මඟින් සිදුවන්නේ විෂය ලෝකය පිළිබඳ පුද්ගලයා දැනුම ලැබීමයි.

විෂය ලෝකය පිළිබඳව පුද්ගලයා ලබන දැනුම ඔහුගේ සංසාරිකත්වය හෝ විමුක්තිය පිළිබඳ තීරණාත්මක සාධකයක් ලෙස බුදුදහමින් සැලකි ඇති බව පෙනේ. විෂය ලෝකය යථා පරිදි වටහා වටහා ගැනීම (සම්මප්පඤ්ඤාය පස්සති) විමුක්තියේ සාධකයක් ලෙසත් එය වැරදි ලෙසින් වටහා ගැනීම සංසාරිකත්වයේ සාධකයක් ලෙසත් විවිධ බෞද්ධ සූත්‍ර දේශනා තුළින් අනාවරණය තොට ඇත. සංසාර ප්‍රවර්තක අනුසය ධර්ම පුද්ගල සන්තානයේ මුල් බැස ගන්නේ විෂය

වස්තු පිළිබඳ ඉන්ද්‍රිය දත්ත මත මානසික ක්‍රියාකාරීත්වය යොමු කිරීමෙන් එම විෂය වස්තු නිගමනයට පෙළඹීමේ ප්‍රතිඵලයක් වශයෙනැයි මධුපිණ්ඩික, මහාතණ්හාසංඛය වැනි සූත්‍රවලින් පෙනේ. පුද්ගලයා විෂය ලෝකය හඳුනා ගන්නේ ඉන්ද්‍රිය ඥානය මාර්ගයෙනි. එම ඉන්ද්‍රිය ඥානමය මානසික ක්‍රියාකාරීත්වය තුළ පුද්ගලයාගේ සංසාරිකත්වය ද සිදුවන බව බුදුසමයේ ආකල්පයයි. ආදි බුදුසමයේ බොහෝ සූත්‍ර දේශනා කළ "විඤ්ඤාණය" යන පදය විග්‍රහයට ලක් වනුයේ විඳීම, විජානනය, දැනගැනීම ආදි අර්ථයන් දැනවීම සඳහාය. විජානාතී ති බො භික්ඛවෙ තස්මා විඤ්ඤාණන්ති වුච්චති. (ම.නි. මහාවේදල්ල සූත්‍රය, බු.ජ.මු., 2003, පි. 686). එයට අනුව මෙම විජානනය හෙවත් දැනීම ආනුභූතික විඤ්ඤාණය, පශ්චාත් ආනුභූතික විඤ්ඤාණය, කර්ම විඤ්ඤාණය යන ආකාර තුනම සිද්ධ වේ. සිත හා සම්බන්ධ වූ මෙම දැනීම් ක්‍රියාවලියෙහි විඤ්ඤාණයෙහි උපයෝගිතාවය සෘජු ය. ආනුභූතික විඤ්ඤාණය තුළ දැනීම ක්‍රියාත්මක වන්නේ යම් කිසිවක් තිබෙන බව හෝ ඇතිබව පිළිබඳ දැනීමයි. එය විඤ්ඤාණය මගින් දැනගන්නවා නොව අරමුණ දැනගැනීමයි. දැනීම පිළිබඳ ප්‍රමාණයෙන් සලකනවිට දැනගැනීමේ චිත්ත ධාරාව ලෙස සැළකිය හැකිය. මේ අනුව හැම දෙයක්ම ඉලක්ක වන දැනීම් ක්‍රියාවලියේ අර්ථය විඤ්ඤාණය හා සම්බන්ධ ය. මේ දැනීම පසිඳුරන් මඟින් ලබන දැනීමයි. "චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං" යන දේශනාව අනුව ඇස රූපය ප්‍රත්‍යකොටගෙන චක්ඛු විඤ්ඤාණය පහළ වේ. මේ ආකාරයටම චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන යන ආයතන හය මූලිකව රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ ධම්ම යන විෂයයන් ප්‍රත්‍යව මෙම විඤඤාණයන් නිර්මාණය වේ. මහාතණ්හා සංඛය සූත්‍රයෙහි දැක්වෙන ආකාරයට ඒ ඒ ගිනි ඒ ඒ ද්‍රව්‍ය අනුව නම් කරන්නාක් මෙන් එම විඤ්ඤාණයන් ද එම ඉන්ද්‍රියන් අදාළව දක්වා ඇත. "මහණෙනි, යම් ප්‍රත්‍යයක් නිසා ගින්න දිලේ ද ඒ ඒ නමින් ඒ ඒ ගින්න ව්‍යවහාරයට පැමිණේ. දර කැබලි නිසා ගින්න දිලේ ද එය දර ගින්න ලෙස ද, ලී කැබලි නිසා ගින්න දිලේ ද එය ලී කැබලි ගින්න ලෙස ද ... ව්‍යවහාරයට පැමිණේ." සෙය්‍යථාපි භික්ඛවෙ යඤ්ඤදේව පච්චයං පටිච්ච අග්ගි ජලති තෙන තෙනෙව සඞ්ඛං ගච්ඡති. කට්ඨංච පටිච්ච අග්ගි ජලති කට්ඨග්ගිතෙව සංඛං ගච්ඡති. සකලිකඤ්ච පටිච්ච අග්ගි ජලති සකලිකග්ගනෙව සඞ්ඛං ගච්ඡති. තිණඤ්ච පටිච්ච

අග්ගි ජලති තිණග්ගිනෙව සඞ්ඛං ගච්ඡති. ගොමයඤ්ච පටිච්ච අග්ගි ජලති ගොමයග්ගිනෙව සඞ්ඛං ගච්ඡති. ථුසඤ්ච පටිච්ච අග්ගි ජලති ථුසග්ගිනෙව සඞ්ඛං ගච්ඡති. සඞ්කාරංච පටිච්ච අග්ගජලති සඞ්කාරග්නිනෙව සඞ්ඛං ගච්ඡති. එව මෙව බො භික්ඛවෙ යඤ්ඤදේව පච්චයං පටිච්ච උප්පජ්ජති විඤ්ඤාණං තෙන තෙනෙව සඞ්ඛං ගච්ඡති. (ම.නි. I. මහායමක වග්ගය. මහාතණ්හා සංඛය සූත්‍රය, පිටු 608 - 609). විඤ්ඤාණයෙන් ඈත්ව අරමුණක් තිබිය හැකිය. නමුත් විඤ්ඤාණයක් නොමැතිව අරමුණක් ඇති බවක් ඇතිවිය නොහැක. විඤ්ඤාණය යනු අරමුණක් ඇති බවයි. යම්කිසි දෙයක් තිබේ යනුවෙන් ඒ ගැන දැනීමක් ඇතිවීම ඉන්‍ද්‍රිය හා ඉන්ද්‍රියාර්ථ සමනයෙන් මනො ධාතුව තුළ මෙය විඤ්ඤාණය ලෙස ප්‍රභවය වේ. එය දැනීමකි. ඒ දැනීම පූර්ණ දැනීමක් නොවේ. යම් වස්තුවක් අදාළ ඉන්‍ද්‍රියට ගෝචර වෙමින් පවතින බව මින් ප්‍රකට ය. මේ පිළිබඳ උගතුන් අතර යම් මතභේද පවතියි. සරච්චන්ද්‍ර මෙම අවස්ථාව නිර්විකල්පිත විඤ්ඤාණ අවස්ථාවක් ලෙස විග්‍රහ කොට ඇත. ඔහුට අනුව ද මෙය පූර්ණ දැනීම් අවස්ථාවක් නොවේ. නිර්විකල්පිත විඤ්ඤාණය යනු අරමුණ තේරුම් ගැනීමට පෙර ඇති වන දැනීම හා සම්බන්ධ අවස්ථාවකි. මෙහි දී විෂය හා සම්බන්ධව පවතින්නේ අසම්පූර්ණ දැනීමක් බව ඔහු පෙන්වා දෙයි. අයෙක් මෙම අවස්ථාව ප්‍රජානන විඤ්ඤාණ අවස්ථාවක් ලෙස දක්වයි. එසේ හඳුන්වන විට ඒ තුළ යම් කිසි පූර්ණ දැනීමක අවකාශයක් පෙන්නුම් කරන බව මෙහිලා දැක්විය හැක. කේ.එන්. ජයතික මහතා ද මෙම විඤ්ඤාණ අවස්ථාව ප්‍රජානන අවස්ථාවක් ලෙස දක්වයි. (Ealy Budddhist theroy of knowladge. p. 436). මෙම අදහස තේරුම් ගැනීම සඳහා ආභිධම්මිකයන් දැරූ මතයන් ද අධ්‍යයනය කිරීම වඩාත් වැදගත් වේ. ආභිධම්මික මතයට අනුව මෙම අවස්ථාව හුදු සංජානන අවස්ථාවකි. මේ තුළින් යථා ප්‍රත්‍යක්ෂය ඉගි නොකරන බව ඔවුන්ගේ මතයයි. එසේම මෙම අවස්ථාව දුර්වල දැනිමක් ලෙසට ද පෙන්වා දිය නොහැක. "දිට්ඨිං" (දැක්කා මෙන්) ලෙස මෙම අවස්ථාව විස්තර වේ. මෙය "දස්සන මත්තං" දර්ශන මාත්‍රයක් ලෙස ද වඩාත් පැහැදිලිව ම දක්වා ඇත. එසේම විෂයේ ප්‍රථම සංගමන අවස්ථා අවදිය ලෙස ද මෙය සළකයි. ඒ තුළ විෂය අනුස්මරණයක් නොමැත. ආභිධම්මිකයන් දක්වන ආකාරයට ආපාත මාත්‍රයක් (ආපාත මත්තං) පමණක් සිදුවන අවස්ථාවක් ලෙසට මෙය විග්‍රහ වී ඇත.

අභිධර්මයට අනුව ඇස සසම්භාර අවස්ථාවකි. එනම් යමක් ලබාග න්නා වූ තැනය. ඇසෙහි ශක්තිවන්ත තැන ප්‍රසාද චක්ඛුවයි. අනෙකුත් ඉන්ද්‍රියයන් හා සම්බන්ධව මේ ප්‍රසාද ලක්ෂණය සහිත තැන දැනීම් හා සම්බන්ධව වැදගත් වේ. මෙම ප්‍රසාද තත්වය පදනමක් ද්වාරයක් ලෙසට ක්‍රියාත්මක වේ. ප්‍රසාද චක්ඛුව ඉතාමත් සියුම් ය. එය මනසින් අනුමාන ලෙස දැනගත යුතුය. කථාවත්ථුවේ දක්වන අන්දමට හුදු චක්ඛුවට හෙවත් හුදු ඇසට යමක් දැකිය නොහැකිය. ඒ සඳහා විඤ්ඤාණයේ සම්බන්ධතාවය අත්‍යවශ්‍ය වේ. "චක්ඛු රූපං න පස්සති අචිත්තකත්තා" (විසුද්ධිමග්ග, පඨමභාග, සීලනිද්දෙස). (ඇස, රූපය නොදකියි. එයට හේතුව ඇසට සිතේ ස්වභාවය නොමැති වීමයි.) එසේම සිතට ද රූපය දැකිය නොහැක. "චිත්ත රූපං න පස්සති. අචක්ඛු කත්තා" හේතුව සිතට ඇසේ ස්වභාවය නොමැති වීමයි. මෙසේ ද්වාර හා අරමුණු සංඝටනයෙන්, චක්ඛු ප්‍රසාදය පාදකවන සිතින් යමක් අසන බව දැනෙන බව දක්වා ඇත. "ද්වාරාරම්මණ සංඝට්ටෙ පන චක්ඛුප්පසාද වත්ථුකෙන චිත්තෙන පස්සති" (විසුද්ධිමග්ග, පඨමභාග, සීලනිද්දෙස). මෙම අවස්ථාව තුළින් චක්ඛු විඤ්ඤාණ හා ප්‍රසාද චක්ඛුව අතර ඇති අවියෝජනීය සම්බන්ධය හුවා දක්වන්නට ආභිධම්මිකයන් උත්සහගෙන ඇත. චක්ඛු ප්‍රසාදයත්, විඤ්ඤාණයත් එකතුව දැකීම ඇතිකරන බව පෙන්වන අතර එය විඤ්ඤාණය මුල්කොටගෙන ඇතිවන්නකි. චක්ඛු පසාදය දැනීමේ මාධ්‍යය ලෙසට ද ද්වාරය ලෙසට ද ක්‍රියාත්මක වේ. (චක්ඛුනා වා කාරන භූතෙන ද්වාර භූත්තෙන රූපං දිස්වා) දැනීමේ නියම මාධ්‍යය විඤ්ඤාණයයි. යම්කිසි වස්තුවක් "ඇත" යන දැනීම ක්‍රියාත්මක කරන්නේ විඤ්ඤාණයේ මෙම නිර්විකල්පික අවස්ථාව තුළිනි. බුද්ධඝෝෂ හිමි මෙය පැහැදිලි කරනුයේ "චක්ඛුනා රූපං දිස්වාති කාරනවසෙන චක්ඛුති ලද්ද වොහාරෙන රූප දස්සන මත්තෙන චක්ඛු විඤ්ඤාණෙන රූපං දිස්වා" රූප දර්ශන මාත්‍රයක් චක්ඛු විඤ්ඤාණයෙන් දැක ඇත. යනුවෙනි. මීට අමතරව විඤ්ඤාණ ක්‍රියාකාරීත්වය පැහැදිලි කිරීමට පසුකාලීන ආභිධම්මික උගතුන් ද උත්සහ කොට ඇත. ධම්මපාල හිමියන්ට අනුව "ඇසට විඤ්ඤාණයෙන් තොරව රූප දැකිය හැකි නම් අනෙකුත් ඉන්ද්‍රියයන්ට ද එස් විෂය ග්‍රහණය කරගත හැකිය. එහෙත්, එය සිදුනොවන බව පෙන්වා දෙන උන්වහන්සේ විඤ්ඤාණයෙන් තොරව ඉන්ද්‍රිය දැනීමක් ලද නොහැකි බව පෙන්වන්නේ සැගවුණු දෙයක් ද එසේ නම් ඉන්ද්‍රියයන්ට දැකිය

හැකි බව දක්වමිනි. මෙසේ ඇස සන්නිශ්‍රිත වූ විඤ්ඤාණය ශබ්ද අසයි. නාසය සන්නිශ්‍රිත වූ විඤ්ඤාණය ගන්ධය දැනගනී. "චක්ඛුම්හි සන්නිස්සිතං විඤ්ඤාණං චක්ඛුවිඤ්ඤාණං" (පයොගසිද්ධිපාළි, සමාස කණ්ඩ).

මෙසේ ආභිධම්මිකයන් දක්වන අන්දමට ඇසින් පමණක් විඤ්ඤාණයෙන් පමණක් රූපාදී අරමුණු ග්‍රහණය කළ නොහැකිය. " කෙවලෙන චක්ඛුනා කෙවලෙන වා විඤ්ඤාණෙන වා රූපදස්සනං නත්‍ථි" (විසුද්ධිමග්ගමහාටීකා, පඨමභාග, සීලනිද්දෙස වණ්ණනා, ඉන්ද්‍රියසංවරසීලවණ්ණනා). එසේ නම් දැනීම් සිදුකර ඇත්තේ චක්ඛු විඤ්ඤාණය යි. චක්ඛු විඤ්ඤාණය කරණකොට ගෙන අදාළ රූප සම්බන්ධ දැනීම ලබන බව මින් ප්‍රකාශ වේ. ආභිධම්මිකයන් චක්ඛු විඤ්ඤාණ ආදි විෂය අවස්ථා ප්‍රත්‍යක්ෂ දැනීමක් ලෙස අර්ථවත් නොකරයි. ඔවුන් මෙම විඤ්ඤාණ අවදිය හුදු දැනීම් මාත්‍රයක් පමණක් ලෙසට සලකයි. "රූප දස්සන සමත්ථෙන චක්ඛු විඤ්ඤාණෙන රූපං දිස්වා" (අනුදීපනීපාඨ, චිත්තසඞ්ගහඅනුදීපනා). යනුවෙන් මෙම අවස්ථාව දක්වා ඇත. මේ නිසා විඤ්ඤාණ අවස්ථාව දැනීම් ක්‍රියාවලියේ වැදගත් වූ එක් සියුම් අවස්ථාවක් පමණි. මෙසේ ආභිධම්මික විග්‍රහයන්ට අනුව චක්ඛු විඤ්ඤාණ ආදි ඉන්ද්‍රිය විඤ්ඤාණ අවස්ථා දර්ශන මාත්‍රයක අවබෝධයක් ලබාදෙන බව දැක්වේ. ආභිධම්මිකයන් මෙම දර්ශන මාත්‍රය උපකරණයක් ලෙසට ද අර්ථ දක්වා ඇත."කාරණවසෙන ලද්ද වොහාරෙන රූප දස්සන මත්තෙන චක්ඛු විඤ්ඤාණෙන රූපං දිස්වා" (අනුදීපනීපාඨ, චිත්තසඞ්ග හඅනුදීපනා). මෙහි දැක්වෙන උපකරණය යන්න අතිමාත්‍රව විග්‍රහ කළ අවස්ථාවක් ලෙසට දැක්විය හැක. අටුවාචාරීන් වහන්සේලා මෙම විඤ්ඤාණ අවස්ථාව හුද දර්ශන, ශ්‍රවණ ඝාණන, චින්තන පූසන අවස්ථාවක් ලෙසට ද විස්තර කිරීමට උත්සහ ගෙන ඇත. චක්ඛු විඤ්ඤෙය්‍යාදි චක්ඛු විඤ්ඤානෙන පස්සිතබ්බො (ම.නි. අටුවාව. II පි. 568). චක්ඛු විඤ්ඤාණ විඤ්ඤාතබ්බ ධම්මෙසු (ම.නි. අටුවාව V. පි. 93). චක්ඛු විඤ්ඤාණන්ති රූප දස්සන මත්තං එව (ම.නි. අටුවාව. II. පි. 349). චක්ඛුම්හි විඤ්ඤාණං චක්ඛුනොවා ජාතං විඤ්ඤාණන්ති චක්ඛු විඤ්ඤාණං (සං.නි. අටුවාව II, පි. 17). අටුවා මතයන්ට අනුව ඉන්ද්‍රිය විඤ්ඤාණ අවස්ථා විෂය දැකීමෙහි මුල් අවස්ථා නියෝජනය කරන බව පෙන්වා දිය හැකිය. මෙම අවස්ථාවන් නිකාය ග්‍රන්ථවල

ප්‍රතිවේද මාර්ගයට සම්බන්ධව භාවිත කළ යුතු ඉන්ද්‍රිය ශික්ෂණය වැඩිය යුතු අවස්ථාවක් ලෙසට ද විග්‍රහ වී ඇත. උදානපාළියේ දී මෙසේ විග්‍රහ වේ. "බාහිය ඔබ මෙසේ හික්මිය යුතුය. යමක් අසන ලද්දේ හුදු අසන ලද්දක් සේ සැලකිය යුතුය. යමක් සිතන ලද්දේ හුදු සිතන ලද්දක් සේ සැලකිය යුතුය. එවං හි තෙ බාහිය සික්ඛිතබ්බං යථො ත්‍වං බාහිය දිට්ඨෙ දිට්ඨමත්තං භවිස්සසි. සුතෙ සුතමත්තං භවිස්සසි මුතෙ මුතමත්තං භවිස්සසි විඤ්ඤාතෙ විඤ්ඤාණමත්තං භවිස්සසි. (ඛු.නි., උපාදාන පාලි, බොධිවග්ග, බාහිය සුත්තං). ඉන්ද්‍රිය ශික්ෂණයක් ලැබීමට අවශ්‍යවන්නෙකු මේ අනුසාරයෙන් ඉන්ද්‍රිය විඤ්ඤාණය අවදියේම අරමුණ හා සබඳව පාලනය කිරීම ඔහුගේ මානසික සංවර්ධනය සඳහා හේතුවන බව උදාන පාලියේ විග්‍රහ වේ. මෙසේ සංක්ෂිප්තව සළකා බලන කල ඉන්ද්‍රිය විඤ්ඤාණ අවස්ථාව යම් අරමුණක් සාකල්‍යයෙන් වටහා ගැනීමට ප්‍රථම ඇතිවන දැනීම හා සම්බන්ධ වූ අවස්ථාවයි. මෙය අසම්පූර්ණ දැනීමකි. එසේ වුවත් දැනීම් ක්‍රියාවලිය එතැනින් නොනැවතී ඉදිරියට ගමන් කරයි. විඤ්ඤාණය ඉන්ද්‍රිය විඤ්ඤාණයෙන් පසුව බැහැර වී ක්‍රියාකාරී වන බව මෙහිලා දැක්විය හැකිය. මීට අමතරව හත්ථිපදෝපම සූත්‍රයේ විඤ්ඤාණයේ ඇතිවන තවත් කොටසක් ගැන දක්වයි. එනම් විඤ්ඤාණ භාගයයි. මෙම පශ්චාත් ආනුභූතික විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය හඟවන්නා වූ අවස්ථාවක් ලෙස සැලකේ. අජ්ඣත්තිකො තෙ ආවුසො මනො අපරිභින්නං හොති. බාහිරා ච ධම්මා ආපාතං ආගච්ඡන්ති. නො ච තජ්ජොව සමන්නාහාරො හොති. නෙවතාව තජ්ජස්ස විඤ්ඤාණභාගස්ස පාතුභාවො හොති. (ම.නි., මූලපණ්ණාසපාළි, ඔපම්ම වග්ග, මහාහත්ථිපදොපම සුත්ත). සූත්‍රයෙහි දැක්වෙන "ඉදින් ආධ්‍යාත්මික වූ මනස නොබිඳුනේ ද බාහිර ධර්මයෝ අපාතයට පැමිණෙන්නේ ද එහෙත් අනුරූපී වූ මෙනෙහි කිරීමක් නොමැති නම් ඒතාක් ඊට අනුරූපී වූ විඤ්ඤාණ භාගයාගේ පහළ වීමක් නොවේ. මෙහි දැක්වෙන "විඤ්ඤාණ භාගය" මෙහිලා වැදගත් අවස්ථාවකි. මෙම වචනය අර්ථවත් කිරීමේදී "විඤ්ඤාණ කොටස් පහළ වීම" යන්න දැක්වේ. විඤ්ඤාණ කොටස යනුවෙන් ප්‍රකාශ කිරීමේ දී තවත් කොටසක් ද ඇති බව ඉන් කියවේ. එක කොටසක් චක්ඛුවිඤ්ඤාණය යි. දෙවන කොටස ඇති වීම සඳහා අවශ්‍ය අංගයක් මෙම සූත්‍රයේ දක්වා ඇත. එනම් තජ්ජසමන්නාහාරයයි. එනම් අනුරූපී මෙනෙහි

කිරීමයි. "භවංග අවට්ටෙත්වා උප්පජ්ජමානො මනසිකාරො" (සං.නි., සළායතනවග්ග අට්ඨකථා, සළායතන සංයුත්ත, පහානසුත්තවණ්ණනා). එනම් භවංග ක්‍රියාකාරීත්වයෙන් තොරව ඇතිවන්නා වූ දෙය පිළිබඳ මෙනෙහි කිරීමයි. "තජ්ජ" යන්න ඉන් උපන්නා වූ අර්ථය ප්‍රකාශ කරයි. මින් අදහස් වන්නේ ඉන්ද්‍රිය, ඉන්ද්‍රියාර්ථ ඝටනයෙන් ඇතිවන මනසිකාර හෙවත් මෙනෙහි කිරීම තුළ මෙම විඤ්ඤාණ භාගය ඇතිවන බවයි. මෙහි දී දැනීමක් ඇති වීම සඳහා හිතාමතා කළ යුතු මෙනෙහි කිරීමක් අවශ්‍ය වේ. මේ මෙනෙහි කිරීමේ ආරම්භක අවස්ථාව ස්පර්ශය නියෝජනය කරයි. "තිණ්ණං සංඝති ඵස්සො" මෙය ගැටීමක් හා බැඳුණු හැඟීමකි. පසුකාලීනව "පොට්ඨබ්බ" යන වචනය මේ සඳහා යොදා ඇත. මින් සිදුවන කාර්යය නම් එකතු කිරීමක් සිදු කරනු ලැබීමයි. ස්පර්ශය ඵලයක් නොව ස්පර්ශයෙන් කරනු ලබනුයේ පූර්ව ඉන්ද්‍රිය හා ඉන්ද්‍රියාර්ථ එකතු කිරීමයි. මෙය කායිකව සිදුවන හමුවීමක් නොවේ. මානසික ධර්ම අතර ඇතිවන එකතුවකි. සූත්‍ර පිටකයේ "පටිඝසම්ඵස්සය" හා "අධිවචන සම්ඵස්සය" යනුවෙන් ස්පර්ශයන් 02 ක් පිළිබඳ දැක් වේ. පටිඝසම්ඵස්සය නම් පඤ්චේන්ද්‍රිය ද්වාර ස්පර්ශයයි. අධිවචන සම්ඵස්සය නම් මනෝද්වාර සපර්ශයයි. මෙසේ මෙම ඉන්ද්‍රිය හා ඉන්ද්‍රියාර්ථ එකතුවීමෙන් අනතුරුව දැනීමේ ක්‍රියාවලිය "වේදනා" අවස්ථාවට ගමන් කරයි. "ඵස්ස පච්චයා වේදනා" මෙහි අවස්ථා 03ක් පිළිබඳ ආදි බුදුසමයේ බොහෝ තැන්හි හමු වේ. එනම් සුඛ වේදනා, දුක්ඛ වේදනා, අදුක්ඛමසුඛ වේදනා යන වේදනාවෝය. මෙම සියලු වේදනාවන් විඤ්ඤාණය හා නිබඳව බැඳී පවතී. විඤ්ඤාණයෙන් බැහැරව එහි සහභාගීත්වයෙන් තොරව කිසිදු වේදනාවක් ඇති නොවේ. විඤ්ඤාණය යන්න විග්‍රහ කිරීමේ දී මෙම කාරණය දක්වා ඇත. "විඤ්ඤාණය යනු කවරේද? එය කුමක් දනී ද, සුවය දනී. දුක්ඛය දනී. අදුක්ඛමසුඛය දනී. තෙන විඤ්ඤාණෙන කිඤ්චි විජානාති. සුඛම්පි විජානාති. දුක්ඛම්පි විජානාති. අදුක්ඛමසුඛම්පි විජානාති. (ම.නි., මූලපණ්ණාසපාළි, චූළයමක වග්ග, මහාවේදල්ල සුත්ත). මහාවේදල්ල සූත්‍රයේ ද මෙම අවයව වෙන් වෙන් කොට පැනවීම අපහසු බව පැහැදිලිවම දක්වා ඇත. ඉමෙසං ධම්මානං විනිබ්බුජිත්වා විනිබ්බුජිත්වා නානාකරණං පඤ්ඤාපෙතුං. (ම.නි., මූලපණ්ණාසපාළි, චූළයමක වග්ග,මහාවේදල්ල සුත්ත). මේ තුළින් පැහැදිලිවනුයේ පුද්ගල දැනීම් ක්‍රියාවලියේ සංවේදනනයට ලැබෙන

ඕනෑම මානසික ක්‍රියාවලියක් විඤ්ඤාණය සමඟ සම්බන්ධව පවත්නා බවයි. මේ පිළිබඳ අදහස් දක්වන රේරුකානේ චන්දවිමල හිමියෝ මෙසේ දක්වා ඇත. "විඤ්ඤාණය කරණ කොටගෙන දැකගන්නා වූ දේවලට ආරම්මණයැයි කියනු ලැබේ. අරමුණුවල හොඳ බවක් හෝ නරක බවක් හෝ මධ්‍යස්ථ බවක් ඇත්තේය. අරමුණුවල ඇති ඒ ස්වභාව තුනට "ආරම්මණ රසය" යැයි කියනු ලැබේ. ආරම්මණය අනෙකකි. ආරම්මණ රසය අනෙකකි. ඒ දෙක එකක් කොට නොසැළකිය යුතුය. රසය ආරම්මණයේ ගුණ විශේෂයකි. විඥානයෙන් ආරම්මණය දැනගනී. එහෙත් එහි රසය විඤ්ඤාණයට නොදැනේ. යම් කිසිවක් අරමුණු කොට විඤ්ඤාණය උපදනා කල්හි එය හා සමඟ ස්පර්ශ චෛතසිකය ද උපදියි. ස්පර්ශයෙන් තොරව කිසිකලෙක විඤ්ඤාණයක් නොඋපදියි. (චන්දවිමල හිමි, රේරුකානේ, 1991, පි. 78). මධුපිණ්ඩික සූත්‍රයෙහි දැක්වෙන ආකාරයට වේදනාවෙන් අනතුරුව සංජානනය සිද්ධ වේ. "යං වේදෙති තං සංජානාති" මෙම සංජානනය ද විඤ්ඤාණය හා බැඳි පවතියි. විඤ්ඤාණය සංඥාවේ උපකාරයෙන් පවති. සංඥාව අරමුණු කොට පවති. සංඥාවේ පිහිටීමෙන් විපුල බවට පැමිණේ. සඤ්ඤාපායං වා දිට්ඨිතා විඤ්ඤාණං තිට්ඨමානං තිට්ඨති. සඤ්ඤමානං සඤ්ඤාපතිට්ඨං (දී.නි.,පාථික වග්ග, සඞ්ගිති සුත්ත). එසේම වේදනාව, සංඥාව හා විඤ්ඤාණය යන ධර්මතා තුනේම බැඳීමක් ද ආදි බුදුසමයෙහි දැකගත හැකි වේ." ඇවැත්නි යම් වේදනාවක් සංඥාවක් විඤ්ඤාණයක් ඇද්ද ඒවා එකතු වී පවතියි. නොවිසිරී පවතියි. මේ ධර්ම වෙන් වෙන් කොට වෙනස පෙන්වන්නට නොහැකිය." යාචාවුසො වෙදනා යා ච සංඥා යංච විඤ්ඤාණං ඉමෙ ධම්මා සංසට්ඨා නො විසංසට්ඨා නා නා කරණං සංඥා පෙතුං (ම.නි. I. පි. 193). මේ පිළිබඳව පසුකාලීනව බොහෝ විද්වතුන් ද සිය ආකල්පයන් දක්වා ඇති අතර සරච්චන්ද්‍ර මහතා ද මෙම අදහස හා එකඟ වේ. මීට අමතරව රීස් ඩේවිස් මැතිණිය ද සඤ්ඤා විඤ්ඤාණ දෙකේ වෙනසක් නොමැති බව ප්‍රකාශ කොට ඇති අතර ඇය දක්වනුයේ පශ්චාත් ආනුභූතික ක්‍රියාවලියේ වේදනාව සඤ්ඤාව යම් වෙනසක් මානසිකව සිදුකරන බවයි. අරමුණු පිළිබඳව වඩාත් නිවැරදි හඳුනාගැනීමක් ද ඒ හා බැඳුණු හැඟීම් දැනගැනීමක් ද විඤ්ඤාණය තදාශ්‍රිතව මෙම අවස්ථාන්තයෙන් සිදුවන බව මෙම ක්‍රියාවලිය දෙස බැලීමේ දී මනාකොට පෙනෙයි. ජබ්බිසෝධන සූත්‍රයේ

විඤ්ඤාණ ක්‍රියාවලිය පූර්ව විඤ්ඤාණ අවස්ථාවක් මෙන්ම පශ්චාත් විඤ්ඤාණ අවස්ථාවක් වෙනම ගම්‍යමාන කරන බව දක්වයි. " ඇවැත්නි ඇසෙහි රූපයෙහි ස්වභාවය චක්ඛු විඤ්ඤාණයෙන් දත යුතුය. චක්ඛුස්මිං ආවුසො රූපෙ චක්ඛුවිඤ්ඤාණෙ චක්ඛුවිඤ්ඤාණවිඤ්ඤාතබ්බෙසු ධම්මෙසු (ම.නි., උපරිපණ්ණාසපාළි, අනුපද වග්ග, ඡබ්බිසොධන සුත්ත). මෙහි දක්වා ඇති චක්ඛු විඤ්ඤාණයෙන් දතයුතු ධර්මයෝ විස්තර කිරීමේදී පශ්චාත් ආනුභූතික විඤ්ඤාණයේ සමස්ථ ක්‍රියාකාරීත්වය අර්ථවත් කරන බව දැක්විය හැකිය. එහි දී විතර්කය ද එක්තරා මෙහෙයක් ඉටු කරන ආකාරය පෙනේ. "යං සංජානාති තං විතක්කෙති" සංජානනය කරන ලද්ද පිළිබඳ නැවත නැවත සිතයි ද එය විතර්කනයයි. කාම විතක්ක, ව්‍යාපාද විතක්ක, විහිංසා විතක්ක වැනි ආචාර විද්‍යාත්මක ඍණාත්මක සිතුවිලි ක්‍රියාත්මක වන්නේ මේ පරිසරය තුළය. දීඝ නිකායෙහි සඳහන් වන ආකාරයට රූප විතක්ක, සද්ධා විතක්ක, ඝාණ විතක්ක ආදි ලෙස ඉන්ද්‍රිය දත්ත මත ඒ ඒ විතර්කන සිතුවිලි ඇති වන බව කියයි. විතර්කය පුද්ගලයා විසින් සිතාමතා තමා විසින්ම සිදුකරනු ලබන්නකි. බුදුදහමට අනුව අකුසල විතර්කයන් හා නිරන්තරයෙන්ම ඡන්ද, දෝස, මෝහ යන මනෝ ධර්මයන් යුක්ත වේ. ඉධ භික්ඛවෙ භික්ඛනො යං නිමිත්තං ආගම්ම යං නිමිත්තං මනසිකරොතො උප්පජ්ජන්ති පාපකා අකුසලා විත්තකා ඡන්දූපසංහිතාපි දොසූපසංහිතාපි මොහූපසංහිතාපි. (ම.නි., මූලපණ්ණාසපාළි, සීහනාදවග්ග, විතක්කසණ්ඨාන සුත්ත). එබැවින් හඳුනා ගන්නා ලද වේදනාවන් තවදුරටත් විතර්කනය කිරීමේ දී ඡන්දය නිසා කාම විතර්කය ද දෝසය නිසා ව්‍යාපාද විතර්කය ද මෝහය නිසා විහිංසා විතර්කය ද නිර්මාණය වේ. මෙම විතර්කය බොහෝ සෙයින් විචාරය හා එකට ගමන් කරන්නා වූ යුගල පද දෙකකි. අරමුණු ගැනීම, සිතීම, විචාරයට ලක් කිරීම ඉන් අදහස් කරයි. මෙය ද විඤ්ඤාණයේ ප්‍රභවය නැතිනම් දැනීම් ක්‍රියාවලියේ තවත් අවස්ථාවක් සේ දැක්විය හැකිය. ඉන් අනතුරුව යොමුවන්නේ ප්‍රපඤ්ච සංඥාවටයි. "යං විතක්කෙති තං පපඤ්චෙති" මෙම අවස්ථාව මානසික ක්‍රියාවලියේ ගැඹුරු අවස්ථාවක් නියෝජනය කරනු ලබයි. මධුපිණ්ඩ සූත්‍රයේ දැක්වෙන ආකාරයට යමක් ප්‍රපඤ්චයට පමුණුවා ද ඒ කරුණින් තෘෂ්ණා දෘෂ්ඨී ප්‍රපඤ්චයන්ගෙන් යුතු සඤ්ඤා කොට්ඨාශයෝ අතීත අනාගත

වර්තමාන වූ ඇසින් දත යුතු රූපයෝ පුද්ගලයා අභිබවනය කරයි. ප්‍රපඤ්ච සඤ්ඤාවකට පත්වීම යනු ලබාගත් අරමුණු හා සම්බන්ධව තෘෂ්ණා, දෘෂ්ඨි, මාන යන මනසේ ක්‍රියාකාරිත්වයේ විස්ථාරණ බවට පත්වීම, නනත්ථකරණයට පත්වීමයි. ප්‍රපඤ්ච අවස්ථාව මානසික ලෙස ස්ථිර මිනිස් නුවණ විෂය ග්‍රහණයකට පත්වීමක් නිර්මාණය කරන අවස්ථාවක් ලෙයට ද සැලකිය හැකිය. සංකල්ප නිර්මාණය වන්නේ මෙම අවස්ථාව තුළය. මෙය පුද්ගලයෙකු විසින් මානසිකව බාහිර ලෝකය ගැන විවිධාකාර මානසික සංකල්ප මැවීමත්, ඒවා විකල්පයනට භාජනය කිරීමත් නැතිනම් භාෂාව තුළින් අර්ථ නිරූපණය කිරීමත් සිදු කරන අවස්ථාවක් වේ. නාම පඤ්ඤත්ති, අත්ත පඤ්ඤත්ති යනුවෙන් දැක්වෙන නාම හා අර්ථගැන්වීම සිදුවන්නේ මෙම අවස්ථාව තුළ බව දැක්වේ. ප්‍රපඤ්චකරණය තුළ සිදුවන ක්‍රියාවලිය අනුසය ධර්ම නිර්මාණය කිරීමට අවශ්‍ය පසුබිම ද ඇති කරනු ලබයි. මෙය අරමුණු අභිනන්දනයට, අභිවාදනයට අජ්ඣොසනයට ලක්වන අවස්ථාවක් බැවින් මෙම අවස්ථාවේ ක්‍රියාත්මක වන විඤ්ඤාණය කර්ම විඤ්ඤාණය ලෙසට ද අටුවාව දක්වා ඇත. චේතනාත්මකව හෙවත් දැනුවත්ව කරන ක්‍රියාව කෙරෙහි යොමුවන සැලකිලිමත් ගතිය ද විඤ්ඤාණය තුළ ඇති වන බව දැක්වේ. (අතුරුගිරියේ ඤාණවිමල හිමි, බුදු දහමේ ඉගැන්වෙන විඤ්ඤාණය, පි. 20). ප්‍රපඤ්චකරණය පිළිබඳ අටුවා විග්‍රහයට අනුව දැක්වෙනුයේ තෘෂ්ණා, දෘෂ්ටි, මාන යන අවස්ථාවන් නිර්මාණය කිරීමක් ලෙසය. පපඤ්චොපි මත්තපමත්තාකාරභාවෙන පවත්තානං තණ්හාදිට්ඨිමානානමෙතං එතං අධිවචනං (ම.නි., මූලපණ්ණාස අට්ඨකථා, සීහනාද වග්ග, චූළසීහනාදසුත්තවණ්ණනා). ඒ තුළින් පුද්ගලයා අතීත, වර්තමාන, අනාගත ධර්ම පිළිබඳ ඇලී ගැලී බැඳී සිටිනු ඇත. මෙසේ ඇලී ගැලී බැඳී සිටීම යනු යමක් ආත්ම වශයෙන් ගැනීමයි. යමක් ආත්ම වශයෙන් ගැනීමට නම් "මම" යන සංකල්පය ගොඩනැගී තිබිය යුතු වේ. "මම" යන්න ගොඩනැගෙන්නේ "මාගේ" යන අයිතිවාසිකම් හා සම්බන්ධ සංකල්පයනයෙන් අනතුරුය. මේ හා සම්බන්ධව විඤ්ඤාණයේ ක්‍රියාකාරීත්වය ඍජු වේ. එය පශ්චාත් ආනුභූතික විඤ්ඤාණය මගින් සිදු වේ. මෙය කර්ම විඤ්ඤාණය හා සම්බන්ධ වන බැවින් එය සංසාරික පැවැත්ම හා බලපායි. යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං විඤ්ඤාණ පච්චයා විඤ්ඤාණස්ස නිරොධෙන - නත්ථි දුක්ඛස්ස

සම්භවො (ඛු.නි. සුත්ත නිපාතය. 737 ගාථා. බු.ජ.මු., පි. 228). මෙසේ විඥ්ඤාණ ක්‍රියාවලිය නිර්විකල්පිත විඥ්ඤාණය හා බැඳුණු සංස්කාර ධර්ම නිසා පශ්චාත් ආනුභූතික විඥ්ඤාණය නිර්මාණය වේ. පශ්චාත් ආනුභූතික විඥ්ඤාණ අවස්ථාව පුද්ගලයෙකුගේ සදාචාර ක්‍රියා හා සම්බන්ධව දැඩි වගකීමක් ප්‍රකාශ කරන අවස්ථාවක් ලෙස දැක්වේ. මෙම අවස්ථාව විෂය ලෝකය නිමිති වශයෙන් හෝ අනුව්‍යඤ්ජන වශයෙන් හෝ ආස්වාද කරනු ලබන අවස්ථාවක් සේ සං.නි. දක්වා ඇත. "මහණෙනි නිමිති ආස්වාදයෙන් බැඳුණා වූ හෝ අනුව්‍යඤ්ජන ආස්වාදයෙන් බැඳුණා වූ හෝ විඥ්ඤාණය තිබෙන්නේ ද ඉදින් කලුරිය කරන්නේ නම් නිරයත් තිරිසන් යෝනියත් යන ගති දෙකෙන් එක්තරා ගතියකට පැමිණෙන්නේය." (සං.නි. IV. පි. 168). මෙම විඥ්ඤාණය සප්‍රමාණ විඥ්ඤාණයක් ලෙස හැඳින්වේ. සවිඥ්ඤාණක බවක් මෙහි ඇත. විඥ්ඤාණය බාහිර අරමුණෙහි විසිරීමත්, වික්ෂිප්ත වීමත් කරණකොට ගෙන සප්‍රමාණ විඥ්ඤාණයක් බවට පත්වන ආකාරය ම.නි. මැනවින් දක්වයි. "මහණෙනි, කෙසේ නම් බැහැර අරමුණෙහි විඥ්ඤාණය වික්ෂිප්ත වූයේ විසිර ගියේ යැයි කියනු ලැබේද? මේ සසුනෙහි භික්ෂුවක් තම ඇසින් රූප දැක නිමිති අනුව ගිය විඥ්ඤාණයක් වේද, රූප නිමිති ආස්වාදයෙන් බැඳුණා වූ රූප නිමිති ආස්වාද සංයෝජනයෙන් සංයුක්ත වූ බාහිර අරමුණු හා වැටුණු විඥ්ඤාණය වික්ෂිප්ත යැයි විසිරුනේ යැයි කියනු ලැබේ. මෙම අවස්ථාව විඥ්ඤාණයත් අනෙකුත් මානසික අවශේෂ ධර්මත් එනම් වේදනා, සංඥා, විතක්ක වැනි අවයව සමඟ සංයුක්ත වීම කරණ කොටගෙන එය කිරීම විඥ්ඤාණයක් බවට නැතිනම් පශ්චාත් ආනුභූතික විඥ්ඤාණයක් බවට පත්වන අයුරු පෙන්නුම් කරයි.

මේ ආකාරයට ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියේ අවසානය ප්‍රපඤ්චකරණය නම් වූ මානසිකත්වය දක්වා දිවයන අතර පුද්ගල මනස තුළ ගොඩනැගනුයේ බාහිර ලෝකය පිළිබඳ විකල්පිත ස්වරූපයක් බව පැහැදිලි වේ. හුදෙක් එය පුද්ගල සන්තානය තුළ නිර්මාණය වූ සිතුවිලි මාත්‍රයක් ලෙස සැළකිය හැකිය. මීට අමතරව මෙම ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලිය තුළ එහි අවසානය විකල්පිත වූ තත්වයක් ලෙස දැක්වීම සඳහා පදනම් වන්නා වූ වෙනත් අදහස් පිළිබව ඳ පෙළ දහමේ සොයාගත හැක. එනම් පුද්ගලයා තුළ පවත්නා වූ ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකාරීත්වය සීමා සහිත වීම කරණ කොටගෙන බාහිර ලෝකය පිළිබඳ නිවැරදි ප්‍රත්‍යක්ෂයක්

වෙත පුද්ගලයාට යොමුවිය නොහැකි බවයි. නිදසුනක් ලෙස ඇතැම් තිරිසන් සතුන්ගේ ඇස්, කන් ආදී ඉන්ද්‍රියයන්ගේ ක්‍රියාකතාරීත්වය පුද්ගල ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය ඉක්මවා පවතියි. එබැවින් ඉන්ද්‍රියයන්ගේ සීමා සහිත භාවය නිසා පුද්ගලයාට නිවැරදි වූ ප්‍රත්‍යක්ෂයක් වෙත යොමුවිය නොහැකිය. මීට අමතරව පුද්ගලයා බාහිර ලෝකය පිළිබඳ ප්‍රත්‍යක්ෂය ලැබීමේදී නිරන්තරයෙන් ඔහු ස්ව ඡන්දරාගාදී ක්ලේශ ධර්මයෝ පදනම් කොට ගනී. ඒ තුළින් ඔහු විෂය අරමුණු පිළිබඳ දැකීමට යොමු වේ. එම නිසා ඔහුට නිවරදි වූ අවබෝධයක් වෙත යා නොහැකිය. යමෙක් ඡන්දය හෙවත් කැමැත්ත මූලික කොටගෙන බාහිර අරමුණු වෙත යොමුවේද ඔහුට එම අරමුණු යහපත් ලෙස, සැපතක් ලෙස නිරීක්ෂණය වේ. එසේම යමෙක් අකමැත්තෙන් හෝ ද්වේෂයෙන් හෝ තරහවෙන් බාහිර අරමුණු පිළිබඳ අවධානය යොමු කරයි ද ඔහුට එම අරමුණු අකැමැති වූ අප්‍රසන්න වූ අරමුණු ලෙස දිස් වේ. මෙසේ පුද්ගලයාගේ ව්‍යවහාරික පැවැත්මට ඉන්ද්‍රිය ඥානය අත්‍යවශ්‍ය වු නමුත් යථාර්ථ දර්ශනයේ දී ඉන්ද්‍රිය ඥානය පුද්ගලයා රවටන සුළුබව දැක්විය හැකිය. පුහුදුන් පුද්ගලයා මෙම ක්‍රියාකාරීත්වය නොදැන ඒ තුළින් "මම", "මගේ" යැයි සාරයක් අපේක්ෂා කරයි. ඉන්ද්‍රිය අද්දැකීම් වල හේතුඵල සම්බන්ධතාව දකින ධර්මවාදියා මෙයින් මුලාවට නොපැමිණෙයි. සත්‍ය ගවේෂණයේ දී ඉන්ද්‍රිය ඥානය පිරිපුන් වූ මෙහෙයක් ඉටු කරන්නේයැයි බුදුසමය පිළිගන්නේ නැත. නික්ලේෂී වූ රහතන් වහන්සේලා ද ව්‍යවහාරික වශයෙන් ඉන්ද්‍රිය ඥානය ලබන නමුත් එමඟින් ස්කන්ධ පෝෂණයක් හෝ අස්මිමාන වර්ධනයක් සිදුකොට නොගනී. යො හොති භික්ඛු අරහං කදාචි - ඛීණාසවො අන්තිමදෙහධාරි අහං වදාමිති'පි සො වදෙය්‍ය - මමං වදන්තීතිපි සො වදෙය්‍ය ලොකෙ සමඤ්ඤං කුසලො විදිත්වා - වොහාර මත්තෙන සො වොහරෙය්‍ය (සං.නි. I අරහන්ත සුත්ත. බු.ජ.මු., පි. 58). ඉමා ඛො චිත්ත ලොක සමඤ්ඤා ලොක නිරුත්තියා ලොක වොහාරා ලොක පඤ්ඤත්තියො යා හි තථාගතො වොහරති අපරාමසන්ති. (සං.නි. I, පොට්ඨපාද සුත්ත, බු.ජ.මු., පි. 436). ඉන්ද්‍රිය ක්‍රියාවලියෙන් සාංසාරික උපයුක්තියක් තිබුණ ද එය අවසාන වශයෙන් සළකන විට ප්‍රහාණය කළ යුත්තකි. තණ්හා, දෘෂ්ටි, මාන වශයෙන් ප්‍රපඤ්ච බිහි කරන්නේ එබැවිනි. යම්තාක්කල් ප්‍රපඤ්චකරණය පවතී ද ඒතාක්කල් සවැදෑරුම් ස්පර්ශායතන පවතියි. එබැවින් එම සළායතනයන්ගේ

නිරවශේෂ නිරෝධයෙන් ප්‍රපඤ්ච නිරෝධය ද ප්‍රපඤ්ච වූපසමය ද සැළසේ. යාවතා ආවුසො ඡන්නං ඵස්සායතනානං ගති. තාවතා පපඤ්චස්ස ගති. යාවතා පපඤ්චස්සගති තාවතා ඡන්නං ඵස්සායතනානං ගති. ඡන්නං ආවුසො ඵස්සායතනානං අසෙස විරාග නිරොධො පපඤ්චනිරොධො. පපඤ්චවූපසමො. (අං.නි. II මහා කොට්ඨීන සුත්ත. බු.ජ.මු. පි. 314). මෙම නිසාම බුදු සමය ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ ක්‍රියාවලියේ දී ඉන්ද්‍රිය භාවනාව, ඉන්ද්‍රිය සංවරය අනුමත කරයි. "ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො" (අං.නි., චතුක්කනිපාතපාළි, චක්ක වග්ග, අපරිහානීය සුත්ත). යනුවෙන් දැක්වෙන්නේ ප්‍රතිපදාවේදී ඉන්ද්‍රියයන්ගේ වසන ලද දොරටු ඇතිවිය යුතු බවයි. ඉන් අදහස් කරන්නේ අරමුණු නොලබා සිටීමක් නොව ලැබෙන අරමුණු අනුසාරයෙන් විපරීත සංඥා ගොඩනැඟීමෙන් මිදීමයි. එනම් ඉන්ද්‍රියයන්ගෙන් අරමුණු ගෙන එය ශුභ, සුඛ වශයෙන් සමස්තයක් ලෙසින් අවයව වශයෙන් ග්‍රහණය නොකිරීමයි. ඉන්ද්‍රියයන් සංවර කර නොගෙන විහරණය කරන පුද්ගලයා අභිජ්ඣා, දොමනස්ස වශයෙන් විවිධ පවිටු අකුසලයන් බිහිකර ගනී ද ඒ අරමණු පිළිබඳ සංවරව පිළිපැදීම මෙයින් අදහස් කරයි. ඉධ මහාරාජ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්‍වාධිකරණ මෙතං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣා දොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති. (දී.නි. I සාමඤ්ඤඵල සූත්‍රය, පි. 122). භාවනා මාර්ගයේදී ඉන්ද්‍රියභාවනාව නිර්දේශ කරන්නේ ද මේ ඉන්ද්‍රිය ඥානය විපරීත සංඥාවන්ට පදනම්වන බැවිනි. අරමුණු සිතින් ලුහුබැඳීම වෙනුවට අරමුණු ඇසුරෙන් ප්‍රභවය වන මානසික ක්‍රියාකාරීත්වය සලකා බැලීමෙන් සිත විපරීත සංඥා බිහිකිරීම වෙනුවට උපේක්ෂාවෙහි පිහිටන ආකාරය ඉන්ද්‍රියභාවනා සූත්‍රයෙහි විග්‍රහ වේ. ඇසින් රූපයක් දැක මනාප වූ හෝ අමනාප වූ හෝ මනාපාමනාප වූ හෝ උපන් බව හෝ අමනාපයක් උපන් බව හෝ මනාපාමනාප සිතක් උපන් බව හෝ දැන එය සංඛත යැයි ද ඕලාරික යැයි ද ප්‍රතීත්‍ය සමුප්පන්න යැයි ද උපේක්ෂාවෙහි පිහිටීම යහපතැයි ද සළකන කල්හි උපන්නා වූ මනාපය ද අමනාපය ද මනාපාමනාප යන සිත ද ඇසිපිය හෙලන තරම් ක්ෂණික කාලයක දී එතරම් ඉක්මණින් අඩු උත්සහයකින් නිරුද්ධ වී සිත උපේක්ෂාවෙහි පිහිටයි. ආර්ය විනයෙහි චක්ඛුර්විඥෙය රූපයන්හි අනුත්තර වූ ඉන්ද්‍රිය භාවනාව නම් මෙයයි.

ඉධානන්ද භික්ඛු චක්ඛුනා රූපං දිස්වා උප්පජ්ජති මනාපං උප්පජ්ජති අමනාපං උප්පජ්ජති මනාපාමනාපං සො එවං පජානාති උප්පන්නං ඛො මෙ ඉදං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං තඤ්ච ඛො සංඛතං ඕලාරිකං පටිච්චසමුප්පන්නං එතං සන්තං එතං පණීතං යදිදං උපෙක්ඛාති. තස්ස තං උප්පන්නං මනාපං උප්පන්නං අමනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති. උපෙක්ඛා සණ්ඨාති. සෙය්‍යථාපි ආනන්ද චක්ඛුමා පුරිසො උම්මීලෙත්වා නිම්මීලෙය්‍ය නිම්මීලිත්වා උම්මීලෙය්‍ය එවමෙව ඛො ආනන්ද යස්ස කස්සචි එවං සීඝං එවං තුවටං එවං අප්පකසිරෙන උප්පන්නං මනාපං උප්පන්නං මනාපාමනාපං නිරුජ්ඣති. උපෙක්ඛා සණ්ඨාති. අයං වුච්චතානන්ද අරියස්ස විනයෙ අනුත්තරා ඉන්‍ද්‍රියභාවනා චක්ඛු විඤ්ඤෙය්‍යෙසු රූපෙසු. (ම.නි., ඉන්‍ද්‍රියභාවනා සූත්‍රය. බු.ජ.මු., පි. 618). මෙසේ බුදුසමය ඉන්‍ද්‍රිය ඥාන විභාගයක් ඉදිරිපත් කරනුයේ පුද්ගල සන්තානගත විමුක්තිය අරමුණු කොටගෙනය. එබැවින් බුදුසමය ඉන්‍ද්‍රිය ඥානය ප්‍රභවයත්, එහි ප්‍රහාණයත්, එහි ඇත්තා වූ අසම්පූර්ණතාවයත් මනාව විග්‍රහ කොට ඇත.

**නිගමනය**

බුදුසමයෙහි යථාර්ථ දර්ශනය, නිවැරදි ප්‍රත්‍යක්ෂය, විමුක්ති සාධනය අර්ථවත් වනුයේ පුද්ගල මානසිකත්වය මූලික කොටගෙනය. එහිදී විඤ්ඤාණයෙහි ඍජු උපයෝගීතාවයක් දැකගත හැකි වේ. එනම් අතීන්‍ද්‍රීය ප්‍රත්‍යක්ෂයයි. අතීන්‍ද්‍රීය ප්‍රත්‍යක්ෂය නිර්මාණය වනුයේ මනස හා ඉන්‍ද්‍රියයන් මූලික කොටගෙනය. කෙනෙකුගේ මනස කොතරම් දියුණු වුව ද මාංස ඉන්‍ද්‍රියය ක්‍රියාකාරීත්වයෙන් තොර වේනම් අතීන්‍ද්‍රිය ප්‍රත්‍යක්ෂය වෙත යොමු විය නොහැකි බව අටුවා මතයයි. නිදසුනක් ලෙස දිබ්බචක්ඛු ඥානය ලබා ගැනීම සඳහා මාංස චක්ඛුසය පුද්ගලයා තුළ විද්‍යාමාන විය යුතුය. මංසචක්ඛුස්ස උප්පාදො මග්ගො දිබ්බස්ස චක්ඛුනො (දී.නි., සීලක්ඛන්ධවග්ගටීකා, සාමඤ්ඤඵලසුත්තවණ්ණනා, ඉද්ධිවිධඤාණාදිකකථාවණ්ණනා). මෙසේ ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වය තුළ අතීන්‍ද්‍රිය ප්‍රත්‍යක්ෂය හෙවත් නිවැරදි ඤාණය නිර්මාණය වනුයේ භාවනාමය ප්‍රඥාව තුළිනි. භාවනාමය ප්‍රඥාව දියුණුවන පමණට සිත කාමච්ඡන්දාදි නීවරණයන්ගෙන් මිදෙන බැවින් රූපාවචර, අරූපාවචර අත්දැකීම් ක්ෂේත්‍රවලට අයත් මානසික ස්වභාවයක්

ඉස්මතු වීමට පටන් ගනියි. "ධ්‍යාන" නමින් දක්වෙන්නේ එම මානසික ස්වභාවයන් ය. මෙසේ ධ්‍යාන සිත් කෙරෙහි යොමු වන පුද්ගලයා ශරීරයේ ස්වභාවයත් එහි අතිරේක බවත් තේරුම් ගනියි. මෙහි දී ඔහු ශරීරයෙන් මනෝමය කය වෙන් කරලීමෙහි සමත් වෙයි. මේ කාර්යය තණ ගසකින් බඩය ඇද, මැත් කිරීමකටත්, කොපුවකින් කඩුව ඇද, මැත් කිරීමකටත්, නයා සැවයෙන් ඉවත් වීමටත් උපමා කර තිබේ. මෙසේ ඉවත් කරගන්නා මනෝමය ශරීරය රූපීමය බවත්, මනෝමය බවත්, සියලු අගපසඟින් සමන්විත ඉන්‍ද්‍රියයන්ගෙන් හීන නොවූවක් බවත් දක්වා තිබේ. සො ඉමම්හා කායං අඤ්ඤං කායං අභිනිම්මිනාති රූපිං මනොමයං සබ්බංගපච්චංගිං අහීනින්‍ද්‍රියං. (දී.නි. I සාමඤ්ඤඵල සුත්ත, බු.ජ.මු., පි, 134). මේ භෞතික ශරීර තත්ත්වයන්ගෙන් මනෝමය කය වෙනස් කරලීමේ හැකියාව ඇති පමණට චිත්ත සමාධිය දියුණු වන පුද්ගලයා තුළ සුවිශේෂ ඥාන ශක්තියක් ප්‍රකාශයට පත් වෙයි. ඒවා අභිඥා වශයෙන් පෙළ දහම දක්වා තිබේ. එනම්, ඉද්ධි විධ, දිබ්බ සෝත, දිබ්බ චක්ඛු, පරචිත්ත විජානන, පුබ්බේනිවාසානුස්සති, ආසවක්ඛය යනු සුවිශේෂී ඥාන විශේෂයෝ ය.

**ඉද්ධිවිධ**:- මනෝමය කයින් හෙවත් මනින්‍ද්‍රිය මඟින් සිදුකරනු ලබන සුවිශේෂි වූ ක්‍රියා කොටසකි. එනම්, එක් අයෙකුව නැවත බොහෝ දෙනෙකු වීම, බොහෝ දෙනෙකු වී පසුව එක් අයෙකු වීම, වරෙක පෙනෙමින් වරෙක අදෘෂ්‍යමාන වීම, භෞතික බාධාවන්හි නොගැටී ආකාශයෙහි මෙන් ගමන් කිරීම, පෘථිවියෙහි දියෙහි මෙන් කිමිදීම, ජලයෙහි ගොඩබිමේ මෙන් ගමන් කිරීම, පක්ෂියෙකු මෙන් ආකාශචාරී වීම යි.

**දිබ්බසොත** :- මිනිසාට ඇසිය නොහැකි සීමාව ඉක්මවා දිව්‍යමය වූද, මානුෂික වූද, දුර වූද, ළඟ වූද, ශබ්දයක් ඇසීම. සො දිබ්බෙන සොත ධාතුයා විසුද්ධාය අතික්කන්ත මනුසිකාය උභො සද්දෙ සුණාති. දිබ්බෙච මානුසෙ ච දූරෙ ච සන්තිකෙ ච (දී.නි. I, සාමඤ්ඤඵල සුත්ත, බු.ජ.මු., පි, 138).

**දිබ්බචක්ඛු** :- මනුෂ්‍ය දෘෂ්ටි සීමාව ඉක්මවා පහත්වූ ද උසස්වූ ද, මනා පැහැ ඇත්තා වූ ද, නොමනා පැහැ ඇත්තාවූ ද, මියගොස් කම් වූ පරිදි සුගතියට හෝ දුගතියට පත්වන සත්වයන්ගේ

චුති- උප්පත්ති දෙක දැකීම. සො දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උප්පජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථා කම්මූපගෙ සත්තෙ පජානාති. (දී.නි. I. සාමඤ්ඤඵල සුත්ත, බු.ජ.මු., පි. 142).

**පරචිත්ත විජානන** :- අන්‍ය සත්වයින්ගේ සිත් සිය සිතින් පිරිසිඳ දැකීම. සො පරසත්තානං පරපුග්ගලානං චෙතසා චෙතො පරිච්ච පජානාති. ස රාගං වා චිත්ත සරාංග චිත්තන්ති පජානාති.... (දී.නි. ෂ. සාමඤ්ඤඵල සුත්ත, බු.ජ.මු., පි. 140).

**පුබ්බේනිවාසානුස්සති** :- සමාධිගත සිතින් යුක්ත පුද්ගලයාට තම පෙර විසූ ස්ඛන්ධ පිළිවෙළ සිහි කිරීමට ඇති හැකියාව මෙහි දී භව එකක් දෙකක් නොව නොයෙක් සංවෘත විවෘත කල්පවල කවර කවර නම් ගොත් ඇතිව, කවර කවරඉසුවදුක් විඳිමින් සිටියා ද යන්න සිහිකළ හැකිය. සො අනෙක විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථීදං එකම්පිජාතිං ද්වෙපි ජාතියො... (දී.නි. I. සාමඤ්ඤඵල සුත්ත, බු.ජ.මු., පි. 140).

ආසවඛයා :- ආශ්‍රයවන් ක්‍ෂය කොට සසර සම්බන්ධ වූ සියලු මනෝ ධර්මයන් ප්‍රහාණය කිරීම. සො එවං සමාහිතෙ චිත්තෙ ...... ආසවානං ඛය ඤාණාය චිත්තං අභිනීහරති, අභිනින්නාමෙති... (දී.නි. I. සාමඤ්ඤඵල සුත්ත, බු.ජ.මු., පි. 144).

මෙසේ භාවනාමය ප්‍රඥාව සංවර්ධනය කිරීමෙන් මාංස ඉන්‍ද්‍රියයන් සංවර්ධනය කොට ලබන්නා වූ අතීන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය තුළින් පුද්ගලයා වෙත යථාර්ථ දර්ශනය වෙත යොමුවිය හැකි බව බුදුදහමේ ඉගැන්වීමයි. එය හුදෙක් මානසිකත්‍වය මුල්කොට සිදුවන්නා වූ ක්‍රියාදාමයක් ලෙස සැළකිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

*අනුදීපනීපාඨ*, චිත්තසඞ්ගහඅනුදීපනා.

*අං.නි.*, චතුක්කනිපාතපාළි, චක්ක වග්ග, අපරිහානීය සුත්ත.

*අං.නි. II* මහා කොට්ඨීන සුත්ත. බු.ජ.මු. පි..

*ඛු.නි., උපාදානපාළි*, බොධිවග්ග, බාහිය සුත්තං.

*ඛු.නි. සුත්තනිපාතය.* 737 ගාථා. බු.ජ.මු..

*දී.නි.*, සීලක්ඛන්ධ වග්ගටීකා, සාමඤ්ඤඵල සුත්තවණ්ණනා, ඉද්ධිවිධඤාණාදිකකථා වණ්ණනා.

*දී.නි. I* සාමඤ්ඤඵල සුත්ත, බු.ජ.මු..

*දී.නි.*,පාථික වග්ග, සඞ්ගිති සුත්ත.

*ම.නි.* මහාවේචල්ල සූත්‍රය, බු.ජ.මු., බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2003.

*ම.නි. I.* මහායමක වග්ගය. මහාතණ්හා සංඛය සූත්‍රය,

*පයොගසිද්ධිපාළි*, සමාසකණ්ඩ

*ම.නි.* අටුවාව. II

*ම.නි.* අටුවාව ඪග

*ම.නි.*, මූලපණ්ණාසපාළි, ඔපම්ම වග්ග, මහාහත්ථිපදොපම සුත්ත.

*ම.නි.*, මූලපණ්ණාසපාළි, චූළයමක වග්ග, මහාවේදල්ල සුත්ත.

*ම.නි. I.*

*ම.නි.*, උපරිපණ්ණාසපාළි, අනුපද වග්ග, ඡබ්බිසොධන සුත්ත.

*ම.නි.*, මූලපණ්ණාසපාළි, සීහනාදවග්ග, විතක්කසණ්ඨානසුත්ත.

*ම.නි.*, මූලපණ්ණාස අට්ඨකථා, සීහනාද වග්ග, චූළසීහනාදසුත්තවණ්ණනා.

*ම.නි.*, ඉන්‍ද්‍රියභාවනා සූත්‍රය. බු.ජ.මු..

*සං.නි.* IV.

*සං.නි. I* අරහන්ත සුත්ත. බු.ජ.මු..

*සං.නි. I*, පොට්ඨපාද සුත්ත, බු.ජ.මු..

*සං.නි., සළායතනවග්ග අට්ඨකථා*, සළායතන සංයුත්ත, පහානසුත්තවණ්ණනා.

*සං.නි.* අටුවාව II,

*විසුද්ධිමග්ග*, පඨමභාග, සීලනිද්දෙස

අබේපාල, රොලන්ඩ්, *අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම*, 2015, සාර ප්‍රකාශන, කොට්ටාව.

*Ealy Budddhist theroy of knowladge.*

චන්දවිමල හිමි, රේරුකානේ, *පටිච්චසමුප්පාද විවරණය*, ශ්‍රී චන්දිවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය, 2, 1991.

අතුරුගිරියේ ඤාණවිමල හිමි, *බුදු දහමේ ඉගැන්වෙන විඤ්ඤාණය.*